සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව தென் மாகாணக் கல்வித் திணைக்களம் Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2024 (2025)
**இறுதி தவணைப் பரீட்சை - 2024 (2025) / Year End Term Test - 2024 (2025)**

ශ්‍රේණිය / தரம் / Grade } 8 ශ්‍රේණිය

# ඉතිහාසය I, II

කාලය / நேரம் / Time } පැය 2 යි

නම / பெயர் / Name } ..............................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ..............................

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

---

- **01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) පණ්ඩුකාභය රජු විසින් ඉදිකරන ලද වැව වන්නේ ,
(1) තිසා වැව (2) හුරුළු වැව (3) බසවක්කුලම වැව (4) කලා වැව

(02) "මෙම දිවයිනේ වැස්සෙන් ලැබෙන ජලය මදකුත් ලෝකෝපකාරයෙන් තොරව මුහුදට නොයේවා" යන ප්‍රකාශය කුමන රජුගේ ප්‍රකාශයක්ද ?
(1) මහා පරාක්‍රමබාහු රජු (2) නිශ්ශංකමල්ල රජු (3) මහා විජයබාහු රජු (4) වසභ රජු

(03) කලා වැවෙන් තිසා වැවට ජලය රැගෙන යාම සඳහා ධාතුසේන රාජ්‍ය සමයේ ඉදිකරන ලද ඇළ මාර්ගය වන්නේ කුමක්ද ?
(1) මිණිපේ ඇළ (2) තල්වතු ඇළ (3) රිදී බැදි ඇළ (4) යෝධ ඇළ

(04) මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා වන්නේ ,
(1) කරලියද්දේ බණ්ඩාර රජු (2) සේනාසම්මත වික්‍රමබාහු රජු
(3) ජයවීර බණ්ඩාර රජු (4) පළමු රාජසිංහ රජු

(05) උඩරට රාජධානි සමයේ මහනුවර නගරයට රැකවරණය ලැබුණු ගංගාව වන්නේ කුමක්ද ?
(2) මහවැලි ගඟ (2) කැළණි ගඟ (3) දැදුරු ඔය (4) කළු ගඟ

- **අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරිනම් (√) ලකුණද වැරදි නම් වැරදි (×) ලකුණද ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.**

(06) සීතාවක රාජසිංහ රජුට උඩරට බලය අල්ලාගැනීමට පේරාදෙනියේ වීරසුන්දර බණ්ඩාර උදව් කරන ලදි. ( )

(07) පළමු විමලධර්මසූරිය නමින් රජවූයේ යමසිංහ බණ්ඩාර වේ. ( )

(08) මහා අස්ථාන කුමරු දෙවන රාජසිංහ නමින් රජ විය. ( )

(09) උඩරට පළමු නායක්කාර් වංශික රජු ශ්‍රී විජය රාජසිංහ රජු වේ. ( )

(10) රාජාධි රාජසිංහ රජු වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවියක් පිරිනමන ලදි. ( )

- **11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාල නිවැරදි පිළිතුර වරහන් තුලින් තෝරන්න.**

(11) ඉංග්‍රීසින් මුහුදුබඩ ප්‍රදේශවල බලය ලන්දේසීන්ගෙන් අත්පත් කර ගන්නා ලද්දේ .......................................... රජුගේ කාලයේදීය. (රාජාධි රාජසිංහ රජු / ශ්‍රී වික්‍රම රාජසිංහ රජු)

(12) ක්‍රි.ව 5 වන සියවසේ රෝම ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසුව ගතවූ වසර දහසක කාලය යුරෝපයේ .................................. යුගය ලෙස හැඳින්වේ. (පුනරුද / මධ්‍යතන)

(13) පුනරුද සමයේ චිත්‍ර ශිල්පියෙකු මෙන්ම ගෘහ නිර්මාණ ශිල්පියෙකු,ඉංජිනේරුවරයකු,කවියෙකු ආදි අංශ වලින් .......................................... කැපී පෙනුනු පුද්ගලයකු විය. (ලියනාඩෝ ඩාවින්චි / මයිකල් ආන්ජිලෝ)

(14) පෘතුවිය ගෝලාකාර බවත් ග්‍රහලෝක සූර්යයා වටා ගමන් කරන බවත් ........................................ විසින් සොයා ගන්නා ලදි. (ජොහැන්නස් කෙප්ලර් / නිකලස් කොපර්නිකස්)

(15) 1498 වර්ෂයේදී වස්කෝද ගාමා ගොඩබසින ලද්දේ ............................................ නගරයටය. (බොම්බාය / කැලිකට්)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන තුල ලියන්න.**

(16) ලන්දේසීන් වෙනුවෙන් ආසියාවේ සියලු කටයුතු සිදු කරන ලද්දේ ................................................ සමාගම විසිනි.

(17) ක්‍රි.ව 1505 දී පෘතුගීසින් ලංකාවට පැමිණෙන විට කෝට්ටේ පාලකයා වූයේ ............................................... රජතුමාය.

(18) පෘතුගීසි සෙන්පති පේරෝලෝපේස්ද සූසා ක්‍රි.ව 1594 දී මෙහෙය වූ සටන වූයේ ........................................ සටනයි.

(19) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් දළදා මාලිගයට ................................................. නම් නව අංගය එකතු කරන ලදි.

(20) පොළොන්නරු අවධියේදී හින්දු බලපෑම හේතුවෙන් සඳකඩ පහනින් ........................................ රූපය ඉවත් විය.

---

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න 4 ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5 කි.

---

(01) අ) පහත දැක්වෙන ලංකා සිතියමෙහි දක්වා ඇති අක්ෂරවලට අදාල නම පහත ලැයිස්තුවෙන් තෝරා පිළිතුරු පත්‍රයේ ලියන්න.

1. හුරුළු වැව
2. ගල්ඔය
3. මහනුවර
4. අනුරාධපුරය
5. දෙවුන්දර තුඩුව
6. දැදුරු ඔය




(ලකුණු 06)

(ආ) (i)



I. රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද ?

II. මෙම නිර්මාණය කල ශිල්පියා කව්ද ?

III. ඔහු විසින් සිදුකළ වෙනත් නිර්මාණයක් නම් කරන්න.

(ලකුණු 03)

(ii)



I. පින්තූරයෙන් දැක්වෙන්නේ කවුද ?

II. ඔහු කුමන ජාතිකයෙක්ද ?

III. ඔහු විසින් සොයාගත් රට කුමක්ද ?

(ලකුණු 03)

(02)

I. පහත සඳහන් වැව් තැනූ රජවරු නම් කරන්න.

A. මයෙන්ත් වැව

B. බානුවාපී වැව

C. මහාදත්තවාපී වැව (ලකුණු 03)

II. විශාල වැව් තැනවීම නිසා ලාංකිකයින් ලබාගත් ජයග්‍රහණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. A. අතීත ලංකාවේ පැවති පොකුණු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

B. අතීතයේ පොකුණු තැනවීමට බලපෑ අවශ්‍යතා තුනක් නම් කරන්න. . (ලකුණු 03)

(03)

I. පිළිම ගෙවල් නිර්මාණය කල ප්‍රධාන සම්ප්‍රදායන් තුන නම් කරන්න. (ලකුණු 03)

II. (A) පුරාණ ආරෝග්‍යා ශාලාවල සාධක හමුවී ඇති ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(B) බෝධි සත්ව ප්‍රතිමා දැකිය හැකි ස්ථාන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

III. අතීත ලංකාවේ කැටයම් කලාව දියුණුව පැවති බව සඳකඩ පහන ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04)

I. මහනුවර නගරයට ආරක්ෂාව සැපයෙන ,

A. දුර්ග දෙකක්

B. ගංගාවක් නම් කරන්න. (ලකුණු 03)

II. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වැදගත්වන උඩරට පාලකයින් සඳහන් කරන්න.

A. ගන්නෝරුව සටනට නායකත්වය දීම

B. 1762 ලන්දේසීන් පලවා හැරීමට ඉංග්‍රීසීන්ගෙන් සහාය පැතීම

C. ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ ඉංග්‍රීසීන්ට යටත් වීම

D. දළදා මාලිගාව ඉදිරිපිට ඇති කිරි මුහුද නම් වැව තැනවූ රජතුමා (ලකුණු 04)

III. මහනුවර යුගයේ චිත්‍ර කලාවේ දැකිය හැකි කැපී පෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(05) I. පුනරුද සමයේ සිටි ගත්කතුවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

II. පහත සඳහන් නිර්මාණ සිදුකළ ශිල්පීන් වරහන් තුලින් තෝරා ලියා දක්වන්න.

A. මොනාලිසා
B. අවසාන විනිශ්චය
C. ශාන්ත ජෝන්ගේ ප්‍රතිමාව
D. දුරේක්ෂය (ලකුණු 04)

(මයිකල් ආන්ජලෝ,ගැලිලීයෝ ගැලිලි,ලියනාඩෝ ඩාවින්චි,ඩොනටෙලෝ,රෆායෙල්,විලියම් හාවේ)

III. (A) පුනරුද සමයේ පූජකවරුන්ගේ දූෂණවලට විරුද්ධව විවේචන එල්ල කළ තිදෙනෙකු නම් කරන්න.

(B) වෛද්‍ය විද්‍යාවේ දියුණුවට වෛද්‍ය පැරසල්සස්ගෙන් සිදුවූ සේවාව සඳහන් කරන්න. (ලකුණු 05)

(06) I. දේශ ගවේශනවලට පසුබිම් වූ හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

II. පහත සඳහන් රටවල් සොයාගත් පුද්ගලයින් නම් කරන්න.

A. ඉන්දියාව
B. ඉස්පැනියෝලාව
C. ඇමරිකා එක්සත් ජනපදය
D. පිලිපීනය (ලකුණු 04)

III. (A) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිත බවට පත් වූ ආසියාතික රටවල් තුනක් නම් කරන්න.

(B) යුරෝපීයන් ආසියාවට පැමිණීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 05)

(07) I. පෘතුග්‍රීසීන් ලංකාවට පැමිණෙන විට පහත සඳහන් රාජ්‍ය පාලනය කළ රජවරු නම් කරන්න.

A. කෝට්ටේ
B. උඩරට
C. යාපනය (ලකුණු 03)

II. ජනතාව කතෝලික ආගමට හරවා ගැනීම සඳහා පෘතුගීසීන් අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. (A) සීතාවක රාජධානියේ උන්නතියට තුඩුදුන් හේතු දෙකක් සඳහන් කරන්න.

(B) සීතාවක රාජධානියේ පරිහානියට මුල් වූ කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

2024 අවසාන වාර විභාගය

8 ශ්‍රේණිය ඉතිහාසය-පිළිතුරු පත්‍රය

I පත්‍රය

1. 03 බසවක්කුලම වැව
2. 01 මහා පරාක්‍රමබාහු රජු
3. 04 යෝධ ඇළ
4. 02 සේනා සම්මත වික්‍රමබාහු
5. 01 මහවැලි ගඟ

6. √
7. x
8. √
9. √
10. x

11. රාජාධිරාජසිංහ
12. මධ්‍යතන
13. ලියනාඩෝ ඩාවින්චි
14. නිකලස් කොපර් නිකස්
15. කැලිකට්
16. පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම/VOC සමාගම
17. අටවන වීර පරාක්‍රමබාහු රජු
18. දන්තුරේ
19. පත්තිරිප්පුව
20. වෘෂභ/ගව

II පත්‍රය

01. (අ)




(ආ) I.)

i. පියෙටා රුව
ii. මයිකල් ආන්ජලෝ
iii. ඩේවිඩ්ගේ ප්‍රතිමාව, මෝසෙස්ගෙ ප්‍රතිමාව

II.)

i. නර්ඩිනන්ඩ් මැගලන්
ii. පෘතුගාලය/පෘතුගීසිය
iii. පිලිපීනය

**02.**

I. A වසභ

B මහසෙන්

C ධාතුසේන

II.

- විශාල වැව්වල වැඩි ජල ධාරිතාවක් ගබඩා කර ගත හැකිවිම නිසා දිගු නියගවල දීත් ජලය හිගය අවම කර ගත හැකි විය.
- විශාල වැව්වල ඇළ මාර්ග මගින් කුඩා ජලාශවලට ලබා ගත හැකිවිම.
- විශාල වැව් නිසා ගංවතුර පාලනය කරගත හැකිවීම.
- විශාල වැව් තැනවීමත් සමග දිගු ඇළ මාර්ග තැනීමේ ශිල්පීය ක්‍රම දියුණු වීම.

III. A. කුමාර පොකුණ, ඇත් පොකුණ, නෙළුම් පොකුණ, කුට්ටම් පොකුණ

B.

- ජලය පරිබෝජනය සඳහා තැන වූ පොකුණු
- වැසි ජලය ක්‍රමානුකූලව බැහැර කිරීමේ පොකුණු
- අලංකාරය සඳහා ඉදිකළ පොකුණු
- පරිසරය සිසල්ව තබා ගැනීමට තැනූ පොකුණු

## 03.

I. ගන්ධ කුටිය සම්ප්‍රදාය
ගෙඩිගේ සම්ප්‍රදාය
ලෙන් විහාර සම්ප්‍රදාය

II. A. මැදිරිගිරිය
මිහින්තලය
ආලාහන පිරිවෙන

B. දඹේගොඩ
බුදුරුවගල
(වැලිගම) කුෂ්ටරාජගල
යටාල වෙහෙර

III. ගොඩනැගිලි ප්‍රවේශ දෙරටු ඉදිරියේ තැනූ අඩසඳ හැඩය ගත් ගල් පුවරුවකි. ගල්පුවරුවේ මැද පිපුනු නෙළුම් මලක අඩක් දැක්වෙන අතර ඒ වටා කුඩා ලියවැල් රවුමක් ද නෙළුම් පොහොට්ටුවක් තුඩින් ගත් හංස පේළියක් ද සිංහ, හස්ති, අශ්ව,වෘෂභ පෙළක් ද කෙළවර ගිනිදැල් හෝ පලා පෙති මෝස්තරයක් ද ඇත.අනුරාධපුර සමයට අයත් කලාත්මක සඳකඩපහන දෙකක් අභයගිරි විහාර භූමියෙන් හමුවීම.

පොළොන්නරු සමය වන විට හින්දු බලපෑම නිසා වෘෂභ රූපය ඩවත් වීම.

**04.**

I. A. බලන

හුන්නස්ගිරිය

B. මහවැලි ගඟ

II. A. දෙවන රාජසිංහ

B. කිර්ති ශ්‍රී රාජසිංහ

C. රාජාධි රාජසිංහ

D.ශ්‍රී වික්‍රම රාජසිංහ

III.

- උගත් නුගත් සියලු දෙනාට තේරුම් ගත හැකි පරිදි චිත්‍ර නිරූපනය කිරීම.
- බිත්ති තීරු වලට යොදා කතාවක් පියවරෙන් පියවර ඉදිරිපත් කිරීමේ දීර්ඝ කතා ක්‍රමය භාවිතා කිරීම.
- එක් එක් රූප රාමුවට යටින් කතා පුවත් කෙටියෙන් නම් කර තිබීම.
- හිස්තැන් පිරවීමට මල් රූප ඇද තිබීම.
- සත්ත්ව ශාක හා මිනිස් රූප වල ප්‍රමාණාත්මක ගුණය නොසලකා හැරීම.
- ශාක ඛනිජ වලින් සාම්ප්‍රදායික වර්ණ සකසා ගෙන තිබීමත් රතු වර්ණය වැඩිපුර භාවිතා කිරීමත් දැකිය හැකිය.
- වෙස්සන්තර, දම්සොඩ, හේලපන්න ජාතක කතා බහුලව චිත්‍රයට නගා තිබීම.
- වර්තමානයේ දඹුල්ල,දෙගල්දොරුව, දළදා මාලිගාව, මුල්කිරිගල ආදී සිථාන වල දැකිය හැකිය.
- 

**05.**

I. ඩාන්ටේ

විලියම් ශේක්ෂ්පියර්

ඉරාස්මස්

II. A.ලියනාඩෝ ඩාවින්චි

B.මයිකල් ආන්ජලෝ

C.ඩොනෙටෙලෝ

D.ගැලීලියෝ ගැලීලි

III. A. ජෝන් වයික්ලින්
ඉරාස්මස්
මාටින් ලූතර්
ජෝන් කැල්වින්

B. ලෙඩ රෝග සෑදීමට තුඩුදෙන හේතු හා ඒවාට ප්‍රතිකර්ම පිළිබඳ අත්පාදා බැලීම.

**06.**

I.

- නිකලස් කොපර්නිකස් විසින් ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම.
- ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝකයේ පිහිටීම පිළිබඳ දැනුම පුළුල් වීම.
- දිගු මුහුදු ගමන් වල දී මාර්ගය සොයා ගැනීමට ඉවහල් වන මාලිමාව උතුරු තරු මාපකය භාවිතය.
- ඈත මුහුදේ යාත්‍රා කළ හැකි විශාල නැව් නිපදවීම.

II. A. වස්කෝද ගාමා
B. ක්‍රිස්ටෝපර් කොලොම්බස්
C. ඇමරිගෝ වෙස්පුචි
D. ෆර්ඩිනන්ඩ් මැගලන්

III. A. ඉන්දියාව
බුරුමය
ශ්‍රී ලංකාව

B .

- ආසියාවේ නිෂ්පාදනය කෙරුණු කුළු බඩු ඇතුළු සෙසු වෙළඳ ද්‍රව්‍ය ලබාගෙන යුරෝපයට ගෙන ගොස් අලෙවි කොට ආර්ථික වශයෙන් ලාභ ලබා ගැනිම
- මුස්ලිම් ජාතිකයන් සතු වූ ආසියාවේ වෙළඳ ඒකාධිකාරය යුරෝපීයන් අතට ලබා ගැනීම.
- ආසියාතික රටවල තම ආගම පැතිරවීම.

**07.**

I. A.අට වන වීර පරාක්‍රමබාහු
B.සේනාසම්මත වික්‍රමබාහු
C.පරරාජසේකරම්

II.

- කතෝලික ආගම වැලඳගත් අයට වරප්‍රසාද දීමනා හා රජයේ තනතුරු ලබා දීම.
- බදු වලින් නිදහස් කිරීම.
- අධ්‍යාපනය ලබා දීම.
- ජනතාවගේ හිත් ඇදගන්නා සුළු උත්සව හා පෙරහැර සංවිධානය කිරීම.
- ශුභ සාධන කටයුතු

III.

A.

- මායාදුන්නේ හා පළමුවන රාජාසිංහ යන රජවරු රනශූරයන් වීම.
- දළදාව සීතාවකට වැඩම කරවීම.
- සීතාවක රජවරුන් අනුගමනය කළ පෘතුගීසී විරෝධී ප්‍රතිපත්ති
- රයිගම රාජධානිය හා උඩරට රාජධානිය සීතාවකට ඈදා ගැනීම.
- කෝට්ටේ රාජධානිය පරිහානියට යාම.

B.

- සීතාවක පාලකයන් නිරන්තර යුද්ධ කිරීමේ ප්‍රතිපත්තියක් ගෙන යාම.
- පළමු රාජසිංහ රජුගේ බෞද්ධ විරෝධී කටයුතු
- විරසුන්දර බණ්ඩාර පළමු රාජසිංහ විසින් මැරවීම.
- පළමු රාජසිංහ රජුගෙන් පසුව සීතාවක රාජසිංහ රාජධානියට නිසි උරුමකරුවෙක් නොමැති වීම.
- පළමු වන විමලධර්මසූරිය රජු උඩරට පාලකයා වීම.